# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 5 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 මාර්තු මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මාර්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 5 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 මාර්තු මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 21/71

**1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 5 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මේ පනතෙහි මින් මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *1966 අංක 37 දරන පනතේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ නිලධරයන් සහ සේවකයෝ.*

21. (1) ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයකට අයත් නොවන ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු හෝ සේවකයකු, එම නිලධරයා හෝ සේවකයා හා සංස්ථාව එකඟ වන නියමයන් සහ කොන්දේසි පිට, නියමිත දිනයෙන් පසු අවුරුදු දෙකක් ඇතුළත දී සංස්ථාව විසින් සේවයෙහි යොදවා ගනු ලැබිය හැකිය ; එවැනි යම් අවස්ථාවක දී 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය. සංස්ථාව විසින් සේවයෙහි යොදවනු ලැබූ එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඔහු එසේ සේවයෙහි යොදවනු ලැබූ දිනයෙන් පසු අවුරුදු දෙකක් ඇතුළත දී, සංස්ථාවේ සේවයෙන් විශ්‍රාම ගැනීමට මනාපය පළකළ හැකිය. ඔහු එසේ සේවයෙහි යොදවනු ලැබූ දිනයේ දී ගුවන් විදුලි දෙපාර්තමේන්තුවෙහි ඔහු දැරූ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් යයි ප්‍රකාශිත තනතුරක්ව තිබුණි නම්, ඔහු එසේ විශ්‍රාම ගැනීමට මනාපය පළ කරතහොත්, මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, ඔහු සංස්ථාවේ සේවයේ යොදවනු ලැබූ දිනයෙහි එම තනතුර අහෝසි කිරීමේ හේතුව මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගියේ නම් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට පිරිනමනු ලැබිය හැකි අත්දමේ ප්‍රදානයකට ඔහු සුදුසු වන්නේ ය.

2—ඒ 03856—9,156 (74/1)

(2) ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයකට අයත් නොවන ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ සේවකයකු නියමිත දිනයෙන් පසු අවුරුදු දෙකක් ඇතුළත සංස්ථාව විසින් සේවයෙහි යොදවා ගනු නො ලබන කල්හි ඔහු විශ්‍රාම ගැන්විය යුතුය ; තවද ඔහු විශ්‍රාම ගන්වනු ලැබූ දිනයෙහි ඒ දෙපාර්තමේන්තුවෙහි ඔහු දැරූ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් යයි ප්‍රකාශිත තනතුරක්ව තිබුණි නම්, විශ්‍රාම ගන්වනු ලැබූ දිනයෙහි එම තනතුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගියේ නම් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට පිරිනමනු ලැබිය හැකි අන්දමේ ප්‍රදානයකට ඔහු සුදුසු වන්නේය.".

ප්‍රධාන පනත ක්‍රියාත්මක වූ දිනයෙහි සිට 2 වන වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වන බව.

3. ප්‍රධාන පනත ක්‍රියාත්මක වූ දිනයෙහි සිට මෙහි 2 වන වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබේ.